


**ශ්‍රී. බු. ව. 2555 වෙසක් මස කලාපය, රා. ව. 2011 ක් වූ මැයි 17 වන දින**

## මාතර,ශ්‍රී සුදර්ශි මහ පිරිවෙන්හි නියෝජ්‍ය පරිවෙනාධිපති දෙවිනුවර, කපුගම, සුධර්මාරාමාධිපති

## ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්වහන්සේ විසිනි.

*නමො තස්ස භගවතො අර්හතො සම්මා සම්බුද්ධස්ස !!!*

# අරඹමු, නික්මෙමු, යෙදෙමු බුදුසසුනෙහි

**සංයුතත නිකායේ අරුණවතී සූත්‍රය ඇසුරින්**

අද වෙසක් පුර පසළොස්වක පොහොය දිනය යි. ගෞතම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වී අද දිනට අවුරුදු 2600 සම්පූර්ණ වෙයි. මෙම 2600 සම්බුද්ධත්ව ජයන්තිය ලෝකවාසී සියලු දෙනාටම ඉතා වැදගත් අවස්ථාවකි. බුද්ධ යනු අවබෝධයට කියන නමකි. අවබෝධ කරගත් දෙය මැනවින් අවබෝධ කර ගැනීම සම්මා සම්බුද්ධ නම් වේ. ගෞතම බුදුරජාණන් වහන්සේ සුමේධ නම් තාපසතුමා ලෙස ජීවත් වූ අවස්ථාවේ දී දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් නියත විවරණය ලැබුවේ අනාගතයෙහි ගෞතම නමින් සම්මා සම්බුදු පදවිය ලබන බවයි. එම සම්මා සම්බුදු පදවිය ලබා අදට අවුරුදු 2600 ගත වෙයි. එදා බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත්තේ ලෝකය යනු චංචල දෙයක් බවයි. ''ලෝකවිදූ'' යන බුද්ධ ගුණයෙන් ඉගැන්වෙන්නේ ලෝකය කැඩෙන බිඳෙන වෙනස්වන එකක් බව යි. එම පණිවිඩය ලෝකයාට හඳුන්වා දී අවුරුදු 2600 ගතවන මේ මොහොත වන විට ගිහි පැවිදි බොහෝ දෙනෙකුට ඒ බව අමතක වී තිබේ. අද බොහෝ දෙනා චංචල ලෝකය තුළ නිශ්චල නිගමනවලට බැස විචාර බුද්ධියෙන් සමුගෙන ක්‍රියා කරන බව පෙනේ.

මෙම වෙසක් පුර පසළොස්වක පොහොය දිනය වෙනත් පොහොය දිනවලට වඩා වැදගත් ලෙස සලකා එය විවිධ ක්‍රම මගින් අනුස්මරණය කිරීමට සූදානම් බව පෙනේ. එහි දී බොහෝ දෙනාගේ ආදර්ශ පාඨය වී ඇත්තේ ''2600 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් පිළිවෙතින් පෙළ ගැසෙමු'' යන්න යි. නමුත් අද ගිහි පැවිදි බොහෝ දෙනාට මේ පිළිවෙත කුමක් ද යන්න අවබෝධ වී නැති බව පෙනේ. ඒ නිසා මෙම දහම් පණිවිඩයෙන් අප බලාපොරොත්තු වන්නේ එම බෞද්ධ පිළිවෙත හඳුන්වා දීම යි. එහි දී සංයුත්ත නිකායේ අරුණවතී සූත්‍රය ඒ සඳහා යොදා ගනිමි.

අප ගෞතම බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන විට දිනක් භික්ෂූන් වහන්සේලා අමතා, ''මහණෙනි , මම ඔබලාට පෙර සිදුවූ දෙයක් දේශනා කරමි.'' යි පැවසූ සේක. අරුණවතී නම් රාජධානියෙහි අරුණවතී නම් රජෙක් විය. එදා වැඩ සිටියේ සිඛී නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය. සිඛී නම් බුදුරජාණන් වහන්සේට අභිභූ සහ සම්භව නමින් අග්‍රශ්‍රාවක දෙනමක් විය. සිඛී බුදුරජාණන් වහන්සේ අභිභූ නම් ශ්‍රාවක හිමියන් අමතා දානයට තව බොහෝ වේලාව ඇති නිසා බඹලොවට ගොස් ඒමට කතිකා කර ගත් සේක. සිඛී බුදුරජාණන් වහන්සේ තම ශිෂ්‍ය අභිභූ හිමියන් සමග බඹලොවට වැඩම කළ සේක. බඹලොවට වැඩමකොට තම ශිෂ්‍යයාට දේශනා කළේ බ්‍රහ්මයා ඇතුලු පිරිසට සිත

සතුටුවන දහමක් දේශනා කරන්න කියා යි. සිඛී බුදුරජාණන් වහන්සේගේ ආරාධනය මත අභිභූ හිමියන් බ්‍රහ්මයා ඇතුලු පිරිසට ධර්මයක් දේශනා කළහ. බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි ශිෂ්‍යයෙක් ධර්මය දේශනා කිරීම පිළිබඳව බ්‍රහ්මයා ඇතුලු පිරිස නොසතුටු වූහ. එහිදී අභිභූ නම් භික්ෂුව පෙනෙන කයින් යුක්තව නොපෙනෙන කයින් යුක්තව විවිධ සෘධි ප්‍රාතිහාර්ය පාමින් ධර්මය දේශනා කළහ. මේ දුටු බඹහු ඇතුළු පිරිස සතුට ට පත් විය. එහිදී සිඛී බුදුරජාණන් වහන්සේ තම ශිෂ්‍ය පුත්‍රයාට දේශනා කළේ දස දහසක් ලෝක ධාතුවලට ඇසෙන සේ මෙම ධර්ම සංනිවේදනය කරන ලෙසටයි. එහිදී අභිභූ නම් හිමියන් බ්‍රහ්ම ලෝකයේ සිට දස දහසක් ලෝක ධාතුවලට ඇසෙන සේ මෙසේ ගාථා ධර්මයක් ප්‍රකාශ කළ සේක.

''ආරභථ නිකඛමථ යුඤජථ බුදධ සාසනෙ

ධුනාථ මචචුනො සෙනං නළාගාරංව කුඤජරො

යො ඉමසමිං ධමම විනයෙ අපපමතෙතා විහෙසසති

පහාය ජාති සංසාරං දුකඛසසනතං කරිසසති ''

(අරුණවතී සූත්‍රය)

''යමක් ආරම්භ කිරීමට වීර්ය කරව්, නික්මීම සඳහා වීර්යය කරව්. බුදු සසුනේ යෙදී ක්‍රියා කරව්. ඇතෙක් බට දඬු වලින් සකස් කළ ගෙයක් වනසා දමන්නාක් මෙන් මාර සෙනග නසව්''

''යමෙක් මේ බුද්ධ සාසනයෙහි ඉහත සඳහන් කළ ආකාරයට අප්‍රමාදීව වාසය කරත් ද ඔහු ජාතිය හා සංසාරය දුරු කොට සියලු දුක් කෙළවර කරන්නේ ය.''

මේ අදහස අභිභූ නම් ශ්‍රාවක හිමියන්ගේ අදහසකි. නමුත් ඒ අදහස සිඛී බුදුරජාණන් වහන්සේගේ සහ අප ගෞතම

බුදුරජාණන්වහන්ගේ ද අනුමැතිය ලැබූ නිසා බුද්ධ භාෂිතයක් බවට පත් වී තිබේ. මේ වැදගත් අදහස අද වැනි දිනයක සිහිපත් කර ගැනීම ගිහි පැවිදි කාගේත් දෙලොව ජයග්‍රහණයට හේතුවක් වේ.

ලංකාවේ බොහෝ පිරිවෙන් වල, පාසැල්වල, වෙනත් රජයේ ආයතනවල වැඩ කටයුතු පටන්ගන්නා විට මේ අදහස සිහිපත් කරනු දැකිය හැක. නමුත් ඒ බොහෝ දෙනා එහි හරි අදහස අවබෝධ කර නොගෙන කටයුතු කරන බව පෙනේ. බුදු දහම යනු අතීතය ගැන සිහි කොට දුක්වන්නාවු ද, අනාගතයෙහි අහස් මාළිගා ප්‍රාර්ථනය කරන්නා වූ ද, දහමක් නොවේ. බුදු දහම යනු මේ පවත්නා වර්තමානය තුළ පවත්නා වූ ක්‍රියා ප්‍රතික්‍රියා දාමයකි.

ඒ නිසා ඉහත කී අදහසේ දී වර්තමාන කාලික මධ්‍යම පුරුෂ බහුවචනයෙන් ප්‍රකාශ කරන්නේ මේ පවත්නා මොහොතතෙහි සම්බුද්ධ පණිවිඩය සඳහා කටයුතු අරඹව්. ඒ ගමන සඳහා නික්මෙව් , බුදු සසුනෙහි යෙදෙව් යන්න ය. මෙසේ ක්‍රියා කරන පුද්ගලයා පිළිවෙතින් පෙළ ගැසෙන කෙනෙකු හැටියට දැක්විය හැක. එය කළ යුත්තේ 2600 සම්බුද්ධත්ව ජයන්තිය සිහිපත් කරන අද පමණක් නොවේ. මුලු ජීවිත කාලය තුළම ඒ පිළිවෙත අප ජීවිතයට අර්ථවත් විය යුතුය.

ඉහතින් ඉදිරිපත් කළ අදහස තුළ වැදගත් අදහසක් ඉදිරිපත් වී තිබේ. ඇතෙකු බට දඬුයෙන් කළ ගෙයක් කඩා දමන්නා සේ මාර සෙනග විනාශ කළ යුතු බවයි. මෙහි එන ''මාර'' යන්න අවබෝධකර ගත යුතුය.

ලෝකයේ පවත්නා හැම ආගමකටම තම ශාස්තෲවරයා ඉදිරිපත් කළ ධර්ම මාර්ගයක් වෙයි. ඊට විරුද්ධව කටයුතු කරන යම් බලවේගයක් වේනම් ඒවා හඳුන්වා ඇත්තේ මාර යන වචනයෙනි. උදාහරණයක් හැටියට ගත හොත් කිතු දහමේ ''සාතන්'' යන අදහසින් උගන්වා ඇත්තේ ඉහත කී මාර

සංකල්පය යි. සංයුත්ත නිකායේ මාර සංයුත්තයම වෙන්වී ඇත්තේ මේ මාර සංකල්පය විස්තර කිරීම සඳහා යි. මෙහි පිළිවෙතින් පෙළ ගැසෙනවායි කියන්නේ එම මාරයින් හඳුනාගෙන ඔවුන්ගෙන් ඈත් වී දුක් කෙළවර කිරීම යි. අප්‍රමාදීව ජීවත්වනවා කියන්නේ එම බෞද්ධ පිළිවෙතට අනුව ජීවිත් වීම යි.

බුදුරජාණන් වහන්සේ ගැන කථා කරන සැදැහැවතුන් නිතර ප්‍රකාශ කරන්නේ අපේ බුදුරජාණන් වහන්සේ කියා යි. මෙම ව්‍යවහාරය ඉතා වැදගත් වෙයි. ඊට හේතුව බුදුරජාණන් වහන්සේ ද ඒ අදහස් අනුමත කිරීම යි. ගිහි පැවිදි අප සියලුම දෙනාට අවවාද කරන්නේ ''සකෙ පෙතතික විසයෙ චරථ'' ''ස්වකීය පියාගේ විෂය තුළ හැසිරෙන්න. ස්වකීය පියාගේ විෂය තුළ හැසිරෙන කිසිවෙකුට මාරයාගෙන් කරදර නොවේ'' කියා යි. මේ පියාගේ විෂය යනු මීට අවු 2600 කට ඉහත අවබෝධ කරගත් ධර්ම මාර්ගය යි.

ජාතක පොතේ සඳහන් භේරිවාද ජාතකය මෙහිදී කෙටියෙන් සිහිපත් කිරීම උචිත බව පෙනේ. පෙර දඹදිව එක් පියෙක් සහ පුතෙක් ජීවත් විය. පියාගේ රැකියාව බෙර වාදනය කිරීම යි. තමා දත් ශාස්ත්‍රය පුතාට ද ඉගැන්වී ය.  දැන් පුතා ද දක්ෂ බෙර වාදකයෙකි . මේ දෙදෙනා සති ගණනක් උත්සවයක බෙර වාදනය කොට ගෙදර එන්නේ මහ කැළෑවක් හමු විය. කැළෑව ළඟට ආ විට පියා පුතාට කීවේ, පුතුනි මේ කැලයේ පල් හොරු සිටිනවා. අපේ ළඟ බොහෝ මුදල් ද ඇති බැවින් ප්‍රවේශමෙන් යා යුතුයි. ඒ නිසා ඔබට පාලුවක් දැනේ නම් ඊශ්වර  පදය පමණක් වාදනය කරන්න කියා යි. මේසේ කී පියා තමාද ඊශ්වර පදය වාදනය කරමින් කැලය මැදින් ගමන් කළ හ. ඊශ්වර පදය ඇසෙන විට පල් හොරු සිතුවේ කැලය මැදින් රජෙක් හෝ මැති ඇමතිකෙනෙක් ගමන් කරන බවයි. ඒ නිසා පල් හොරු බයවී දුවන්නට පටන් ගත් හ. හොරු දුවන බව පියාටවත් පුතාටවත් නොපෙනේ. පුතා මෙහිදී සිතන්නේ අපේ පියා පරණ මිනිසෙකි. ඔහු වයන්නේ පරණ පදමය. ඒ පදවලින් කවර වැඩක් ද ? තවත්

කොතරම් අලුත් පද තිබේ දැයි කියා පියා එපා යයි කී අලුත් පදයක් වාදනය කළහ. දුවන හොරු නැවතී කල්පනා කළේ රජෙක් හෝ මැති ඇමති කෙනෙක් යන විට ඔවැනි පද වාදනය නොකරති. මෙසේ සිතා ඇවිත් බලන විට පියා සහ පුතා පමණක් කැලේ මැදින් යනු දැක දෙදෙනාට වධ හිංසා කොට මුදල් පැහැරගෙන ගියෝ ය. මේ ජාතක කථාව උගන්වන සදුපදේශය වන්නේ පියා කියන පද හැර වෙනත් පද වාදනය කළොත් අප මාරයාගේ ගොදුරක් වන බවයි. ඒ අනුව අපේ ගෞතම බුදු පියාණන් වහන්සේ අවු 2600 කට පෙර ඉගැන් වූ පද නම් බොහෝම පැරණි ය. නමුත් ඒ පද ගසන ගිහි පැවිදි කාටවත් මාරයාගෙන් කරදර ඇති නොවේ. ඒ පදවලට අනුව ක්‍රියා කිරීම පිළිවෙතින් පෙළ ගැසීම යනුවෙන් අදහස් කළ හැක.

ඉහත සඳහන් කළ බට කෝටුවලින් සැදුම්ලත් ගෙය යනුවෙන් හඳුන්වන්නේ පංචකාම ලෝකය යි. නැති මමත්වයක් ගොඩනගා ගෙන අපි බොහෝ දෙනෙක් මාරයාගේ පක්ෂයෙහි සාමාජිකයින් වී සිටිමු. අද බොහෝ දෙනක් බෞද්ධ වැඩ පිළිවෙල ලෙස හඳුනාගෙන තිබෙන්නේ මාර වැඩ ය. ඒවා බුදුරජාණන් වහන්සේ විසින් තහනම් කරන ලද මාර වැඩ බව අපට නොවැටහේ. ඒ නිසා ගිහි පැවිදි අපි බොහෝ දෙනෙක් මාර බන්ධනවලට හසුවී මමත්වාරෝපිත ලෝකයක් තුළ දුකින් ජීවත් වෙමු. යමෙක් මේ ධර්ම විනය උගන්වන චංචල ලෝකය පිළිබඳව හොඳින් අවබෝධකරගෙන ජීවත් වුවහොත් මාර බන්ධනවලින් මිදී දුක් කෙළවර කරගත හැක.

මීට අවුරුදු 2600 කට ඉහත දී බුදුන්වහන්සේ බරණැස ඉසිපතන නම් වු මිගදායේ දී මුලු මහත් ලෝකයාටම දේශනා කළේ ඇති වූ සියල්ල නැති වන බවයි. විශ්ව සාධාරණ අනිත්‍යතාවය නම් වූ ඒ පණිවිඩය අනන්ත ලක්ඛණ සූත්‍රයේ දී තව දුරටත් විස්තර කරමින් රූප - වේදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණ යන උපාදානස්ඛන්ධ සහ තිලකුණට නගා විස්තර කරයි. මේ දේශනා කළ මග මාර පාස වලින් මිදෙන මගයි. නමුත් බොහෝ දෙනෙකුට

එදා බුදුන්වහන්සේ අනිත්‍යයයි දේශනා කළ දේ නිත්‍ය බවට පත්කර ගැනීමට අවශ්‍යව තිබෙන බව පෙනේ. පසුගිය දිනෙක ගුවන් විදුලියෙන් මෙවැනි ගීතයක් අසන්නට ලැබිණි. ''ලියාගන්න සින්නක්කර දෙනවද මට ඔය ඇස් දෙක'' බුදුන්වහන්සේ මීට අවුරුදු 2600 කට ඉහත දී අනිත්‍යය යි කී ඇස් දෙක අද වන විට සින්නක්කර ගැනීමට සිතන බව පෙනේ. තව ටික කාලයක් යනවිට ''ලියාගන්න සින්නක්කර දෙනවද මට ඔය කන් දෙක'' යනුවෙන් ගීත ඇසෙන්නට පුළුවන . මේ කුමක් ද සිදුවී ඇත්තේ. බුදුන්වහන්සේ දේශනා කළ විශ්ව සාධාරණ අනිත්‍යතාවය අමතක වී අප මාර බන්ධන වලට හසු වී ඇති බව යි. මෙසේ ඉදිරියට ගමන් කළොත් දුක් කෙළවර කිරීමට නොහැකි වෙයි.

එසේනම් බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්ම මාර්ගය තුළ සඳහන් දාන, සීල, භාවනා, යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන් අර්ථවත්ව ඉටු කරමින් පිළිවෙතින් පෙළ ගැසිය යුතු යි. වෙසක් පෝය දිනවල බොහෝ දෙනා බුදුන්වහන්සේට ආමිසයෙන් පූජා කරනු පෙනේ. එම ආමිස පූජා බොහෝ විට බුදුන්වහන්සේ අනුමත කළ දේ නොවෙයි. විවිධ සැරසිලි සඳහා වෙසක් සමය තුළ බොහෝ දෙනෙක් පෙළ ගැසෙනවිට තවත් පිරිසක් ඒ තුළින් පීඩනයට පත් වේ. ආර්ථික දුෂ්කරතා ඇති මෙවන් වකවානුවක් තුළ එවැනි හිංසාකාරී කටයුතු වලින් වෙන්වී ක්‍රියා කිරීම පිළිවෙතින් පෙළ ගැසීම ලෙස දැක්විය හැක.

දානය ඉතා වැදගත් වැඩ පිළිවෙලකි. අපේ ගෞතම බුදුරජාණන් වහන්සේ සුමේධ තාපස අවධියේ ආරම්භ කළේ ඒ වැඩ පිළිවෙලයි. එහි පරිත්‍යාගී චේතනාව නිර්ලෝභී හැඟුම ඉදිරිපත් විය යුතු ය. නමුත් අද බොහෝ දෙනා දෙන දානවලින් කෙරෙන්නේ තව තවත් සසර දිගුකර ගැනීම යි. තරඟකාරී දාන ක්‍රමයක් අද සමාජයේ නිර්මාණය වී තිබේ. සසර කෙටිකරගෙන නිවන දෙසට යොමුවනවා වෙනුවට සසර දිගුකරගෙන දුකට පත්වීම ඒ දානය තුළ දැකිය හැක. අද සමහරු දෙන දාන විනෝද සංග්‍රහ තත්වයට පත් වී ඇත. ඒවා බුදුන්වහන්සේ දේශනා කළ

දානයට කිසිසේත් සමාන කළ නොහැක. ඒ දාන හැඳින්විය හැක්කේ බට කෝටුවලින් ගෙවල් නිර්මාණය කිරීමක් හැටියට යි. ඒවා කඩා බිඳ දැමීම සඳහා උත්සාහ කළ යුතුයයි දේශනා කර ඇතත් අද බොහෝ දෙනා එවැනි ගෙවල් නිර්මාණය කර ගැන්මක් නූතන බොහෝ දානවලින් දැකිය හැක. සමහර දාන තුළින් මහා ප්‍රදර්ශනයක් දැකිය හැක.

පසුගිය දිනෙක දානයකට ගියෙමි. එහි පිරිකර පූජා කිරීමට පමණක් විනාඩි 45 ක් පමණ ගතවිය. කුඩා කුඩා පිරිකර වර්ග අටපිරිකර ආදී බොහෝ පූජා භාණ්ඩ තිබුණි. ඒ හැම පිරිකරක්ම දායකයින් එක් එක්කෙනා ගෙනවිත් පූජා කළහ. එක නමකට පූජා කරන සියල්ල එක්තැන් කර පූජා කළේ නම් කෙතරම් වටී ද? එසේ කළොත් මෙතරම් දෙයක් පූජා කළා යයි ප්‍රදර්ශනය නොවෙයි. අන්තිමේ දී පංසලේ ලොකුහාමුදුරුවන් පූජා කරන ලියුම් කවරයෙන් පිරිකර පූජාව අවසන් වෙයි. මෙවැනි ප්‍රදර්ශන දාන වලින් මිදී පරිත්‍යාගී හැඟුමෙන් දන් දී සසර කෙටිකර ගනිමු.

සීලය ද ඉතා වැදගත් පිළිවෙතකි. සමාජය තුළ ජීවත් වන මිනිසාගේ මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කරදීමේ වැඩ පිළිවෙලක් ඒ මගින් නිර්දේශවෙයි. අවු 2600 කට ඉහත දී දේශනා කළ පරණ පද 05 පන්සිල් නමින් නිර්දේශ වී ඇත. ඒ පද පරණ උනාට ඒවා ආරක්ෂා කළොත් මාරයාගෙන් කරදර නොවෙයි. අද බොහෝ දෙනා ඒ පද 5 කිසිසේත් සැලකිල්ලට නොගෙන ක්‍රියා කරමින් මාර පාසවලට හසු වී දුක් විඳින බව පෙනේ. ඒ නිසා බොරුවට සීල ව්‍යාපාර නොපවත්වා අපට හැකි පරිදි හොඳින් සිල් ආරක්ෂා කරගෙන සසර කෙටිකර ගැනීමට උත්සාවහත් වෙමු.

භාවනාව ද ඉතා වැදගත් වැඩ පිළිවෙලකි. සමාජයෙන් ඇසෙන පුවත් වලින් පෙනී යන්නේ රට රවටන බොරු භාවනා

කරුවන් සමාජය තුල ජීවත් වන බවයි. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මහණෙනි ලාභ සත්කාර ඉතා දරුණු බවයි. ලාභ සත්කාර අපේක්ෂාවෙන් කරන භාවනාවෙන් ප්‍රයෝජනයක් නැත. භාවනාව යනු සිතට නොගැළපෙන ආහාර වලින් සිත මුදවා ගෙන සිත ට ගැළපෙන ආහාර වර්ග ලබා දීම යි.

ඒ නිසා ඉහත කී වැඩ පිළිවෙල 2600 සම්බුද්ධත්ව ජයන්තියට පමණක් සීමා නොකොට දිවි ඇති තෙක් පවත්වා ගෙන යාමට අධිෂ්ඨාන කර ගත යුතු ය. ඒ නිසා අද සිට ඒ වැඩ පිළිවෙල අරඹමු. ඒ වැඩ පිළිවෙලට ආදාළ නොවන දෙයින් නික්මෙමු . අදාළ වැඩ වල යෙදෙමු. මෙසේ ක්‍රියා කොට ඇතෙකු සේ බට කෝටු ගෙවල් කඩා බිඳ දමා දෙලොව ජය ගනිමු. එය හැමදෙනාගේම වෙසක් දින අධිෂ්ඨානය කර ගනිමු.